# නිරසංකල්පීය ලොවක් වේ ද?

සුලෝචන වික්‍රමසිංහ මහතා අසා ඇති ප්‍රශ්නවලින් වඩාත් ම වැදගත් වන්නේ යථාර්ථවාදය ගැන අසා තිබූ ප්‍රශ්නය හෙයින් ඒ පිළිබඳ ව තවදුරටත් කරුණු දැක්වීමට අදහස් කරමි. බටහිර ඊනියා යථාර්ථවාදී නවකතාව මාක්ස්වාදය මෙන් ම මෙරට මුල් බැස ගෙන නැත. යම් අදහසක් මුල් බැස ගෙන ඇත් ද නැත් ද යන්න විමසා බැලීමේ දී ඒ සම්බන්ධ පොත් කොපමණ විකිණෙන්නේ ද නැත් ද යන ප්‍රශ්නය අදාළ නොවනවා විය හැකි ය. එහෙත් ඊනියා යථාර්ථවාදී නවකතා මෙරට නො විකෙණෙන බව නම් පැහැදිලි ය. ඒ නවකතා විවිධ විභාගවලට නියම නොකරන්නට එතරම් සංඛ්‍යාවක්වත් ඊනියා යථාර්ථවාදී පොත් නොවිකෙණනු ඇත. අනෙක් අතට ගම්පෙරළිය පළකර අවුරුදු හැටකට පසුවත් එවැනි උසස් කෘතියක් සිංහලෙන් පළකිරීමට නොහැකි වී ඇතැයි ඇතැම් විචාරකයන් කියන්නේ මේ නවකතා රීතිය අපට දිරවාගත නොහැකි නිසා යැයි සිතමි. ගම්පෙරළිය උසස් කෘතියක් යැයි මා අද අදහස් කරන බවක් මෙයින් ගම්‍ය නොවන බව අවධාරණය කළ යුතු ය.

මාක්ස්වාදයත් යථාර්ථවාදයත් මෙරට සාමාන්‍ය ජනයා අතින් ප්‍රතික්ෂෙප වී ඇත්තේ එක් අතෙකින් ඊනියා යථාර්ථය මෙරට සංස්කෘතියෙහි නොපිළිගැනෙන බැවින් යැයි සිතිය හැකි ය. කලාකරුවන් තම තමන්ට සාපේක්ෂව කලා කෘති නිර්මාණය කරන නමුත් ඊනියා බුද්ධිමත්තු බටහිර පොතක් පතක් කියවා කලාකරුවන්ට තම කෘති මගින් ඊනියා යථාර්ථයක් නිරූපණය කෙරන බවක් කීමට බලකරති. ඒ බලකිරීමක් වන්නේ සමාජයීය පිළිගැනීම එවැනි කියුම් කෙරුම් මත රඳා පවතින බැවිනි. මෙහි සමාජයීය පිළිගැනීමක් යනුවෙන් අදහස් කරන්නේ සමාජයේ බලවත් වී ඇති, එනම් බල ආධිපත්‍යයක් දරණ ඊනියා බුද්ධිමතුන් අතින් කෙරෙන පිළිගැනීමක් මිස සාමාන්‍ය මිනිසුන් අතින් කෙරෙන පිළිගැනීමක් නො වේ. සමාජයෙහි වඩාත් වැදගත් වන්නේ යැයි සිතීමට අප පොළඹවා ඇත්තේ සමාජයෙහි බල ආධිපත්‍යය දරණ පිරිස විසින් කෙරෙන පිළිගැනීම මිස සාමාන්‍ය මිනිසුන් අතින් කෙරෙන පිළිගැනීම නො වේ.

අනෙක් අතට ඒ සීමිත පිරිසක් සමාජයෙහි එවැනි ආධිපත්‍යයක් දරණ පිරිසක් බවට පත් වී ඇත්තේ බටහිර සංස්කෘතික, දේශපාලනික හා ආර්ථික යටත්විජිතවාදයේ බල මහිමයෙනි. අද ලෝකයේ ආධිපත්‍යය ඇත්තේ බටහිර අදහස්වලට බව අමුතුවෙන් කිවයුතු නො වේ. ඒ අදහස් මෙරට සමාජයට හඳුන්වා දෙන්නන්ට සමාජයේ තැනක් ලබාදීමට විවිධ ආයතන පිහිටුවනු ලැබ ඇත. අද ඒ සඳහා ඊනියා රාජ්‍ය නොවන ආයතන ද වෙයි. විශ්වවිද්‍යාල යනු එවැනි හඳුන්වාදීමේ ආයතන අතර ප්‍රධාන තැනක් ගන්නා ආයතන වෙයි. මෙරට විශ්වවිද්‍යාලවලින් මුළුමනින් ම මෙන් ලැබෙන්නේ බටහිර අධ්‍යාපනයකි. එහි කථිකාචාර්යවරු හා අනෙක් බුද්ධිමතුන් යැයි හැඳින්වෙන්නෝ බටහිර අදහස් සමාජයට ගෙන යන වෙළෙඳ නියෝජිතයෝ, ඔවුන්ගේ බසින් ම කියන්නේ නම් සේල්ස් රෙප්ලා පමණක් වෙති.

මාර්ටින් වික්‍රමසිංහ මහතා ඊනියා යථාර්ථවාදී නවකතා ලියන්නට පටන්ගෙන තරමක කාලයක් ගතවන තුරු ඒ මහතාට සමාජ පිළිගැනීමක් නො වීය. ඒ පිළිගැනීම ඔහුට ලබාදුන්නේ ලංඩන් විශ්වවිද්‍යාලයේ ඉගෙන පශ්චාත් උපාධි ලබා ලංකා විශ්වවිද්‍යාලයට පැමිණි එදිරිවීර සරච්චන්ද්‍ර මහතා ය. සරච්චන්ද්‍ර මහතාට ලංකා විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරයකු ලෙස ලැබුණු බල ආධිපත්‍යයක් විය. ලංකා විශ්වවිද්‍යාලයට එවැනි බලයක් ලැබුණේ එය බටහිර සංස්කෘතික ආධිපත්‍යය මෙරට තහවුරුකිරීම සඳහා පිහිටුවනු ලැබූ ආයතනයක් වීම නිසා ය. සරච්චන්ද්‍ර මහතා විසින් කෙරුණේ බටහිර නවකතා විචාරය මෙරටට හඳුන්වාදීම ය. ඒ මහතා අතින් ඒ නොකෙරෙන්නට වෙනත් කෙනකු අතින් ඒ කෙරෙන්නට තිබිණි. මාර්ටින් වික්‍රමසිංහ මහතා උඩට ගනු ලැබුයේත් පියදාස සිරිසේන මහතා පැත්තකට තල්ලු කරනු ලැබුයේත් ලංඩන් විශ්වවිද්‍යාලයේ බල මහිමය විසිනි. එසේ උඩට ගනු ලැබුවත් විභාගවලට නියම නොකෙරෙන ඊනියා යථාර්ථවාදී නවකතා මෙරට අලෙවි නො වෙයි. එකල පියදාස සිරිසේන මහතාගේ නවකතාත් (එවා නවකතා ලෙස පිළිගැනීම හෝ නොගෙනීම හුදෙක් මිනුම් දණ්ඩක් මත තීරණය වන්නක් මිස ඊනියා වාස්තවික වූ නිගමනයක් නො වේ.) වර්තමානයෙහි පසුගිය දා අභාවප්‍රාප්ත වූ ජයසේන ජයකොඩි මහතාගේ නවකතාත් අලෙවි වන්නේ කුමක් නිසා ද යන්න තේරුම් ගැනීමට උත්සාහ කළ යුතු ය.

අප එකිනෙකාගේ ලෝක එකිනෙකින් වෙනස් ය. අප ලෝකය දකින්නේ විවිධාකාරයෙනි. එයින් මා අදහස් කරන්නේ අපෙන් තොරව පවතින ලෝකයක් අප එකිනෙකා විවිධාකාරයෙන් දකින බව නො වේ. අප දකින ලෝකය සංස්කරණය කරනු ලබන්නේ අප විසින් ම ය. ඒ සංස්කරණය කෙරෙන ලෝක එකිනෙකින් වෙනස් වෙයි. ලංකාවේ කෝටි දෙකක

© Prof. Nalin De Silva

ජනගහණයක් වේ නම් ඔවුන් දකින ලෝක කෝටි දෙකක් වෙයි. එහෙත් අපි එකිනෙකා සමග සන්නිවේදනය කර ගනිමු. එහි දී අපට හැඟෙන්නේ අප කතාකරන්නේ එකම ලෝකයක් ගැන බව ය. එයට ප්‍රධාන හේතුව අප එකිනෙකාට අඩු වැඩි වශයෙන් වුවත් සමාන ඉන්ද්‍රිය පිහිටා තිබීමත් අපේ මනස් බොහෝ දුරට එක සමාන අයුරකින් ක්‍රියාකරන නිසාත් ය. අප එකිනෙකාට විවිධ ඉන්ද්‍රිය තිබිණි නම් අපට විවිධ ප්‍රශ්නවලට මුහුණ පෑමට තිබිණි.

වර්ණ අන්ධතාවෙන් පෙළෙන පුද්ගලයන්ගේ ලෝක අනෙක් අයගේ ලෝකවලින් වෙනස් ය. යමකුට කිව හැක්කේ එවැනි අඩු ලුහුඬු කමක් ඇති විට සම්මුතියෙන්  ඊනියා නිවැරදිතාවක් ඇතිකර ගත හැකි බව ය. එහෙත් මෙහි දී අපි ඉතා භයානක උපකල්පනයක් කරමු. එනම් අඩු ලුහුඬුකම්වලින් තොර යැයි පැවසෙන ඉන්ද්‍රිය ඇති අය සංස්කරණය කරන ලෝක (අවශ්‍ය නම් දකින ලෝකය) නිවැරදි බව ය. අපේ ඉන්ද්‍රිය ගැන අප එතරම් විශ්වාසයක් තබාගන්නේ කෙසේ ද? අප ලබා ඇති ඉන්ද්‍රිය පද්ධතිය සර්ව සම්පූර්ණ ද? මිනිසුන් නොවන බොහෝ සතුන්ට ද මිනිසුන්ට වැනි ඉන්ද්‍රිය ඇත. ඇතැම් සතුනට මිනිසුනට නොමැති ඉන්ද්‍රිය ඇති අතර තවත් සතුන්ගේ ඉන්ද්‍රිය මිනිසුන්ගේ අනුරූප ඉන්ද්‍රියවලට වඩා වර්ධනය වී ඇත.

උදාහරණයකට ඇතැම් මත්ස්‍යයන්ට අප විසින් චුම්බකත්වය යනුවෙන් හැඳින්වෙන ගුණය දැනගැනීමට හැකි යැයි බටහිර විද්‍යාඥයෝ ම කියති. මේ බටහිර විද්‍යාඥයන්ට අනුව ඇතැම් මත්ස්‍යයෝ සිතති. ටික කලකට පෙර සතුන්ට සිතන්නට නොහැකි යැයි කීවෝ ද බටහිර විද්‍යාඥයෝ ය. ඒ කෙසේ වෙතත් කුරුල්ලන්ට මත්ස්‍යයන්ට වැනි ඇතැම් සත්වයනට චුම්බකත්වය ගෝචරවන ඉන්ද්‍රියයක් හෝ ඉන්ද්‍රිය හෝ ඇති බව පෙනී යයි. මිනිසුන්ට එවැනි ඉන්ද්‍රියයක් නොමැති බැවින් අප ඊනියා චුම්බකත්වය දැනගන්නේ වක්‍රව ය. ඇතැම් ද්‍රව්‍යවලට අල්පෙනෙත්ති වැනි දෑ ආකර්ෂණය වන බව නිරීක්ෂණය කරන මිනිස්සු ඒ ද්‍රව්‍යවල චුම්බකත්වයක් ඇතැයි ගනිති.

බල්ලනට අපට නොඇසෙන ශබ්ද ඇසෙන බවත් අපට නැති ඉවක් ඇති බවත් බොහෝ කලක සිට මිනිස්සු දනිති. ඉන් පැහැදිලි වන්නේ ඔවුන්ගේ ශ්‍රවණේන්ද්‍රිය හා ආඝ්‍රාණයේ දී යොදාගන්නා ඉන්ද්‍රිය මිනිසුන්ගේ අදාළ ඉන්ද්‍රියවලට වඩා අඩුම තරමින් ඇතැම් අංගවලින් වර්ධනය වී ඇති බව ය. මේ කරුණුවලින් පැහැදිලිවන්නේ ඇතැම් සතුනට මිනිසුන්ට නොමැති ඉන්ද්‍රිය ඇති බවත් තවත් ඇතැම් සතුන්ගේ ඇතැම් ඉන්ද්‍රිය ඇතැම් අංගවලින් මිනිසුන්ගේ අදාළ ඉන්ද්‍රියවලට වඩා වර්ධනය වී ඇති බවත් ය.

වැඩි දුර යෑමට පෙර පැහැදිලි කිරීමක් කළ යුතු වෙයි. මා මත්ස්‍යයනට චුම්බකත්වය ගෝචරවන ඉන්ද්‍රියයක් හෝ සමහරවිට ඉන්ද්‍රිය හෝ ඇති බව සඳහන් කරන්නේත් බල්ලන්ට මිනිසුන්ට වඩා ඉවක් ඇති බව සඳහන් කරන්නේත් එවැනි දෑ වාස්තවිකව පවතින්නේ ය යන අර්ථයකින් නො වේ. චුම්බකත්වය ඉව ආදී මේ සියල්ල පමණක් නොව මා නම් සංකල්පය ද අප විසින් සංස්කරණය කරනු ලැබූ දේ ය. මා ද නොපවතින කල මා විසින් පවතින්නේ යැයි හඳුනාගනු ලබන දේ පවතින්නේ කෙසේ ද? මා මෙහි සඳහන් කරන සියළු සංකල්ප සම්මුති අර්ථයකින් පමණක් යොදා ගැනෙන ශූන්‍ය වූ දෑ පමණ ය. සංකල්පීය ලෝකය ශූන්‍ය වෙයි. අප කිසිවකුට සංකල්පීය ලෝක හැරෙන්නට වෙනත් ලෝකයක් වේ ද? එවැනි නිරසංකල්පීය (සංකල්පීය නොවන යන තේරුමෙන්) ලෝකයක් ගැන කිවහැකි පුද්ගලයකු මා දන්නා තරමින් මෙළොව පහළ වී නැත. එවැනි පුද්ගලයකු වේ නම් හෝ එවැන්නකුගෙන් ඒ පිළිබඳ දැනගත් අයකු වේ නම් හෝ නිරසංකල්පීය ව ඒ නිරසංකල්පීය ලෝකය දැනගනු කැමැත්තෙමි.

ඊනියා යථාර්ථය නිරූපණය කරන නවකතාවක් සිංහලෙන් තබා ප්‍රංශ බසින් හෝ රුසියන් බසින් හෝ ලියැවී ඇත් ද? එවැනි නවකතාවක් ලියැවී ඇති බව දැනගැනීමට නම් පළමුව යථාර්ථය යනු කුමක් දැයි දැනගත යුතු ය. එහෙත් අප යථාර්ථය දැනගන්නේ කෙසේ ද? ඒ සඳහා වූ නිර්ණායක කවරේ ද? පංති සමාජය, පංති ගැටුම ආදිය යථාර්ථය ද? නවකතාවක චරිත පංති සමාජයක පංති ගැටුම පසුබිම් කරගෙන විකාශය වේ නම් ඒ නවකතාව යථාර්ථවාදී නවකතාවක් ද? ඊනියා සමාජ යථාර්ථය දැනගත හැක්කේ මාක්ස්වාදය ඇසුරෙන් ද? අද වන විට මාක්ස්වාදය මාක්ස්වාදීන්ට ම සුපුරුදු බසින් කියන්නේ නම් ඉතිහාසයේ කුණු කූඩයට එක් වී ඇත්තේ එය ද යථාර්ථය බැවින් ද? එසේත් නැත්නම් යථාර්ථය යනු වෙන ප්‍රවාදයක් මගින් දැනගත යුත්තක් ද? ප්‍රවාද සංකල්ප ආදිය නොමැතිව දැනගත හැකි යථාර්ථයක් වේ ද?   (මතු සම්බන්ධයි)

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva